(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 180.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2017 ජූලි මස 07 සිකුරාදා පූ. භා. 10.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෙයික්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩිලාන් පෙරේරා මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **දිළුම් අමුණුගම මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **රංජිත් අලුවිහාරේ මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **චන්ද්‍රසිරි ගජදීර මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු **නිහාල් ගලප්පත්ති මහතා**

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා**

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු සෙය්යිඩ් අලි සාහීර් මවුලානා මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**

**ගරු හේෂාන් විතානගේ මහතා**

**ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු මාවෙයි සෝ. සේනාධිරාජා මහතා**

**ගරු චතුර සංදීප සේනාරත්න මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2016 අංක 24 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2017.05.01 සිට 2017.05.31 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන පිළිගන්වා, එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2013 සහ 2014 වර්ෂ සඳහා රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තා පිළිගන්වා, එම වාර්තා අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. පාර්ලිමේන්තුවේ කටයුතු :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1, 2, 3, 4, 5, 6, 7, 8, 9 සහ 10 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 20 (7) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, 2017 ජූලි මස 25 වැනි අඟහරුවාදා, 26 වැනි බදාදා, 27 වැනි බ්‍රහස්පතින්දා සහ 28 වැනි සිකුරාදා පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දිනයන් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, 2017 ජූලි මස 25 වැනි අඟහරුවාදා, 26 වැනි බදාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 7.30 දක්වා විය යුතු ය. අ. භා. 6.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 7.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, 2017 ජූලි මස 27 වැනි බ්‍රහස්පතින්දා සහ 28 වැනි සිකුරාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 10.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.30 සිට අ. භා. 7.30 දක්වා ද විය යුතු ය. අ. භා. 6.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 7.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 4) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2017 ජූලි මස 25 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. උපාධිධාරීන් සඳහා රැකියා ලබා දීමේදී නිසි ක්‍රමවේදයක් සකස් කිරීම :** ගරු හේෂාන් විතානගේ මහතා, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— ශ්‍රී ලංකාවේ උපාධිධාරීන්ට රැකියා ලබා දීමේදී මෙතෙක් කල් ක්‍රියාත්මක වූ පක්ෂ පාට භේද ක්‍රමය නොසලකා සාධාරණය ඉටුකිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සැලසුම් කර එය ප්‍රතිපත්තියක් ලෙස සම්මත කිරීමට පියවර ගන්නා ලෙසත්, දේශපාලනඥයන් හමුවේ උපාධිධාරීන් හැල්ලුවට පත් නොකිරීමට පියවර ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි. (පා.150/'15)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් පිහිටුවීම :** ගරු සිසිර ජයකොඩි මහතා, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ අති විශාල තරුණ පිරිසක් ඒවායින් අත්මිදීමට අපේක්ෂාවෙන් පසුවුවද, ඒ සඳහා නිශ්චිත වැඩපිළිවෙළක් හෝ ක්‍රමවේදයක් නොමැතිවීම ඔවුන් මුහුණ දෙන බරපතල ගැටලුවක්ව ඇති බැවින්, ආගමික නායකයන්ගේ මූලිකත්වයෙන් බෞද්ධ ආධ්‍යාත්මික භාවනා ක්‍රම, දේශීය ඖෂධ ක්‍රමයන් හා අනෙකුත් ප්‍රතිකර්ම ක්‍රමද උපයෝගී

කරගනිමින් මත්කුඩු හා මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් පිහිටුවීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි. (පා.179/'16)

(පූ. භා. 11.29 ට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. පුත්තලම දිස්ත්‍රික්කය ජාතික සහජීවනයේ හා සංහිඳියාවේ දිස්ත්‍රික්කය ලෙස නම් කිරීම :** ගරු අශෝක ප්‍රියන්ත මහතා, ගරු එස්. එම්. මරික්කාර් මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පුත්තලම දිස්ත්‍රික්කයේ බෞද්ධ, කතෝලික, මුස්ලිම් යන විවිධ ජන කණ්ඩායම් වසර ගණනාවක සිට ඉතා සාමයෙන් හා සමගියෙන් ජීවත්වන බැවින්, වත්මන් යහපාලන රජයේ ප්‍රමුඛ අරමුණක් වන සහජීවනය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම උදෙසා මෙම දිස්ත්‍රික්කය ජාතික සහජීවනයේ හා සංහිඳියාවේ දිස්ත්‍රික්කය ලෙස නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි. (පා.189/'17)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. පෙර පාසල් අධ්‍යාපනය නඟා සිටුවීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කිරීම :** ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— රටට වැඩදායී යහපත් පිරිපුන් පුද්ගලයන් බිහි කිරීමේ මූලික තෝතැන්න වන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන විශාල සංඛ්‍යාවක් රට පුරා පැවතියද, ඉන් බහුතරයක් නිසි ප්‍රමිතියකින් හා ක්‍රමවේදයකින් තොරව පවත්වා ගෙන යාම හේතුවෙන්, දරුවන්ගේ පෞරුෂ වර්ධනයේත්, සාරධර්ම හා මූලික අධ්‍යාපන පෙළගැස්මේත්, සෘණාත්මක බවක් දක්නට ලැබෙන හෙයින්, පෙර පාසල් අධ්‍යාපන මධ්‍යස්ථානවල භෞතික පහසුකම් පවත්වා ගැනීම, සුදුසුකම් සහිත පාලිකාවන් පත් කිරීම, ඉගැන්වීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය සුරැකීම සඳහා ඔවුන් පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම මෙන්ම, මධ්‍යස්ථාන පාලිකාවන් සඳහා නිශ්චිත වැටුප්/දීමනා ලබාදීම මඟින් ඔවුන්ගේ අනාගත සුරක්ෂිතභාවය ඇති කිරීම තුළින් පෙර පාසල් අධ්‍යාපනය නඟා සිටුවීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි. (පා.190/'17)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. කල් තැබීම :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 1.39 ට, අද දින සභා සම්මතිය අනුව, 2017 ජූලි මස 25 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.